82129

සියලු ම හිමිකම් ඇවිරිණි]
(முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

**71 S I**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2005 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2005 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2005

සිංහල I
சிங்களம் I
Sinhala I

පැ තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

1. (අ) පහත දැක්වෙන ගද්‍ය පද්‍ය පාඨයන්හි **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන කෙරෙහි අවධානය යොමු කරමින් **ඡේද හතරක** අර්ථ ලිහිල් බසින් ලියන්න. **තද කළු** අකුරෙන් මුද්‍රිත වචන සඳහා ඔබ දෙන අර්ථ යටින් **ඉරි** අඳින්න.

(i) උන් දෑ එක් දවසක් පොහෝගෙයි වත්මුරය පැමිණ පාත් පුදලා හුන් දෑ පහන්දල් සිඳෙන නියාවත් **ප්‍රබන්ධොත්පත්ති** වශයෙන් උපදනා නියාවත් දැක මේ සත්වයෝත් භවෝත්පත්තිය නවතාගත නුහුණු නම් උපදිති. උපන්නවුන්ට මරණ ඒකාන්තභාවී හෙයින් මියෙති. අනුපධිශේෂ නිර්වාණධාතුයෙන් නිවියාහු ම නොපෙනෙති ඇවිළෙන පහන ම පෙවූ අතට සම්භ වූ ආයුධයක් මෙන් අරමුණු කළහ. බුදුහුත් ගඳකිළියේ වැඩ හිඳ ම රස්කඳක් අභිමුඛයට විහිදුවා ලා ළඟ වැඩහිඳ කථා කරන්නාක් මෙන් ගෝතමීනි, ඒ එසේ ම ය. මේ සත්වයෝ නම් විඥප්තිරූප හා ලක්ෂණරූප හැර සෙසු රූපයන් චිත්තක්ෂණ සතළොසකට මුත් වඩා ආයු නැති හෙයිනුත්, අරූපධර්මයෙන් **උත්පාද ස්ථිති භංග සංඛ්‍යාත** ත්‍රිලක්ෂණයෙහි මුත් වඩා නොපවත්නා හෙයිනුත් ක්ෂණිකමරණිනුත් සන්තතිමරණිනුත් මියෙති.

නැතහොත්

රජගහ නුවර එක් සොළොස් ඇවිරිදි විතර වූ සිටුදුවණි කෙනෙක් විශිෂ්ට වූ රූපශෝභාවක් ඇත්තාහ. ඉතා ප්‍රසාදවහයෝ ය. ඒ වයස පිරී සිටි ස්ත්‍රීහු ද යෞවනමදයෙන් මත් හෙයින් පුරුෂයන් කෙරෙහි ලොල්කම ඇත්තෝ ය. උන්ගේ දෙමව්පියෝ ද උන් මිථ්‍යාචාරයෙන් නවතනු නියා එක කෙල්ලක මේයට ලා සත්මාල් මාලිගාවේ උඩුමාලේ ශ්‍රීයහන් ගබඩාවෙක රූපත් ව උපන්නාට **පාටොපයට** සිරගෙයක ලූවා සේ ලූහ. එක් කුලදරුවකු සොරකමෙක දී අල්වා ගෙන පිටිතල හයා බැඳගෙන **සැමිටිවලින් මරමරා** මිනී මරන තෙනට ගෙන යෙති. ඒ සිටුදුවණියෝ ද මහත් වූ කෝලාහල නිසා මේ කිම් දෝ හෝ යි මතුමාලේ සිට බලන්නෝ මරන්ට ගෙනයන තැනැත්තවු දැක ඔහු කෙරෙහි පිළිබඳ සිත් ඇති ව ඌ ම පතා බතුත් නො කා යානට නැඟී ලා වැදහොත්තෝ ය.

(ii) එකල බෝධිසත්ත්වයන්ගේ පය යපටකින් මැසූ කලක් පරිද්දෙන් ඇසිර ගියේ ය. ඉක්බිති මල කඩා ගනිමියි සිතා ඇදි ඇදි සේ පළමු කොට කකුලේ සම් කැඩී ගියේ ය. දෙවෙනි ව මස් කැඩී ගියේ ය. තුන් වෙනුව **ඇටයෙහි ඇසිර සිට** ලේ වැහෙන්නට පටන්ගෙන බලවත් වූ දුක්ඛවේදනා පැවැත්තේ ය. එකල බෝධිසත්ත්වයෝ ඉදින් මම බැගෑපත් ව ඇඩීම් නම් මාගේ බන්ධූහු යහපත් ව ගොදුරු නො කා සා දුකින් පලායන්නාහු දුර්වල ව සමුද්‍රයෙහි වැටී යන්නාහ යි බන්ධූන් කෙරෙහි කරුණාවෙන් දුක්ඛයෙන් වේදනාව ඉවසා හංස සමූහයා කැමති පරිද්දෙන් කා බී කෙළින්ට පටන් ගත් කල්හි බෝධිසත්ත්වයෝ **බද්ධරාවයෙන් මහහඬින් හැඬූහ**. ඒ අසා හංස සමූහයෝ මරණ භයින් තැතිගෙන තුන් මුළක් ව බෙදී චිත්‍රකූට පර්වතයට ගියාහු ය.

(iii) ඇවැත්නි, අනද මහතෙරහු තමන්ගේ බහුශ්‍රැතභාවය හේතු කොට ගෙන පණ්ඩිත ස්වභාවයෙන් උපායෙහි තමන් දක්ෂ හෙයින් බොහෝ දෙනාට පීඩා නො කොට ම උපාය ශක්තියෙන් රජ්ජුරුවන්ට මැණික ඇරගෙන දෙව්හයි කියා මෙවෙනි කථාවෙන් උපලක්ෂිත ව වැඩ හුන් කල්හි **සුරාසුරවරචක්‍රවාරුචූඩාමාණික්‍ය** මරීචිස්වය පරිචුම්බිත **චරණනඛමයුඛ** ඇති තිලෝක ස්වාමී වූ තිලෝගුරු බුදුරජාණන් වහන්සේ ශ්‍රී ගන්ධ කුටියෙහි වැඩ හිඳ දිව්‍යශ්‍රෝත ධාතුයෙන් ඒ භික්ෂූන් වහන්සේ කියමින් උන් කථා ප්‍රබන්ධය අසා වදරා මේ භික්ෂූහු ආනන්ද ස්ථවිරයන්ගේ ගුණකථනය කෙරෙමින් උන්නාහ. එතනට ගිය කල්හි තමන් කියමින් උන් කථා මට කියන්නාහු ය.

(iv) **පවි රද** කඳ නා ලෝ මුල් දිගතු — බර
ලෙව් තුරු සුසැදි යස මිණි මුතු මල් — පතර
සව් සිරි පිරි සුර පුර වන් කැලණි — පුර
දෙව් මෙ හසුන් විබිසණ සුරිඳුට — පවර

[ දෙවැනි පිටුව බලන්න.

(v) ශිලිය නො දී සැට මහණුන් බව  **මහණ**
මලිය දෙව් තෙරිඳු වැඩ හිඳ දෙසූ  බණ
දිලිය පස් මහල් පායෙහි මිණි  කිරණ
බැලිය හැකි විනම් දක වැඳ යා  කලණ  (ලකුණු 16 යි.)

(ආ) පහත සඳහන් උද්ධෘතයන් අතුරෙන් **හතරක** අවස්ථා සම්බන්ධය දක්වන්න.

(i) "ඒ දරුවන්ගේත් තොපගේත් කවර වරදෙක් ද?"
(ii) "මේ තොපගේ දෝෂ වන්නේ ය. මාගේ දෝෂයක් නැත්තේ ය."
(iii) "අපට සරදම් කරන අදහසින් මේ කියන්නේ සිසින් ගොතා ගත් බොරු කතාවක්"
(iv) "ඔයා ශිහිල්ල වාඩි වෙන්න. මට මේව බලාගන්න පුළුවන්"
(v) "දුලා නෙතුපුලා - දිසි ස්වර්ණලතා සේ මෙ ලඳ ......"  (ලකුණු 12 යි.)

(ඉ) පහත සඳහන් කවි පෙළ පිළිබඳ රසාස්වාදයක් සපයන්න.

වැලිතල අතරේ - හෙමිහිට බසිනා
නේරංජන නදියේ
ගයා හිස - වැඩ සිට - බුදු වුණු ;
තිලෝ හිමි - මොක්සුව ලද මොහොතේ
සමාදී - බාවනා

හිමකඳු වැටියේ - සීතල සෙවණේ
වන්දන - තුරු පිහිරා
හැපී එන - මල් මුව රඳ රසිනේ
සුවඳ මුසු - කෝමල මඳ පවනේ
ගැවිලා - පාවෙනා

සත්සර නගලා - වික වික පෙලවී
සිරි මහ බෝ හිමිගේ
මනෝහර - පලුපත් අතු රිකිළි
නටා ගිය - කාලෙහි රස නැඟුණා
සරාගී - ජීවනා

සඟමිත් මෙහෙණී - දකුණේ සාකා
සිරිලක ගෙන ආ ද
සිටම තව - මහමෙවුනා උයනේ
නටයි කොළ - වන්නම් ලෙස මහබෝ
සුමීරි - නාදෙනා  (ලකුණු 12 යි.)

2. "ධර්මසේන හිමියන්ගේ ස්වතන්ත්‍රතාව වඩාත් ඉස්මතුව පෙනෙන්නේ, කථා කීමේ දී යොද ගත් රචනෝපක්‍රම හේතුවෙනි." සද්ධර්මරත්නාවලියෙහි නියමිත කතාවස්තු දෙකක් ඇසුරු කොට මේ අදහස නිදසුන් සහිත ව විමසන්න.

**නැතහොත්**

"රස විඳ ගැනීමට හානියක් නො වන සේ සදචාරාත්මක කරුණු ඉදිරිපත් කිරීම ජාතකකතාකරුවාගේ අරමුණ වූයේ ය." නියමිත කථා දෙකක් වත් ඇසුරු කොට මේ මතය නිදසුන් සහිත ව විමසන්න.  (ලකුණු 15 යි.)

3. "සැළලිහිණි සන්දේශය රසවත් කාව්‍යයක් වන්නේ, කවියා ඇසූ, දුටු දෑ හා විඳි අත්දැකීම් එම කාව්‍යයට පදනම් කොට ගත් නිසා ය. **වර්ණනා තුනක්වත්** පදනම් කර ගනිමින් උක්ත කියමන විභාග කරන්න.  (ලකුණු 15 යි.)

4. "යුගාන්තය, චරිත නිරූපණය කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වමින් රචිත නවකතාවකි." යුගාන්තය නවකතාවේ ඔබ කැමති **චරිත තුනක්** ඇසුරු කොට ගෙන නිදසුන් සහිත ව මෙම කියමන සාකච්ඡා කරන්න.  (ලකුණු 15 යි.)

5. "පාඨකයාට වින්දනයක් ලබා දෙන අතර ම පුද්ගලයන් තුළ ඇති දුර්වලකම් උපහාසයට ලක් කිරීම ද ඇතැම් කෙටිකතාකරුවන්ගේ අරමුණ වන්නේ ය." **තම්බු පිස්සුව** කෙටිකතාව ඇසුරෙන් මෙම කියමන සාකච්ඡා කරන්න.  (ලකුණු 15 යි.)

6. "නිසඳැස් කවීහු කවියේ බස්වහර, සංකල්ප රූප හා වස්තු විෂය යන අංශවලින් සිංහල කවියට අලුතු මුහුණුවරක් ගෙන දීමට උත්සාහ දරූහ." නූතන පද්‍ය සංග්‍රහය ඇසුරෙන් නිදසුන් **තුනක්වත්** ඇතුළත් වන සේ මෙම අදහස් පිරික්සන්න.  (ලකුණු 15 යි.)

7. "මනමේ නාට්‍යයෙහි විශේෂතාව වන්නේ එහි නිරූපිත චරිත ස්වාභාවික මිනිස් හැසිරීම් ලෙස පිළිගත හැකි වීම ය."  (ලකුණු 15 යි.)

www.pastpaperlk.com
www.artsapi.lk

82129

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
Department of Examinations, Sri Lanka

**71 S II**

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2005 අප්‍රේල්
கல்விப் பொதுத் தராதரப் பத்திர(உயர் தர)ப் பரீட்சை, 2005 ஏப்பிரல்
General Certificate of Education (Adv. Level) Examination, April 2005

සිංහල II
சிங்களம் II
Sinhala II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

* 1. 2. 3 ප්‍රශ්න ඇතුළු ව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

1. පහත දැක්වෙන ව්‍යුහගත ඡේද අතුරෙන් **එකක්** තෝරා ගෙන **රචනාවක්** ලියන්න.

(i) ජන මාධ්‍යයන්හි සිංහල භාෂා භාවිතය අරබයා බොහෝ ගැටලු පැන නැඟී ඇත. සම්මත ව්‍යාකරණ රීති ගරු නො කිරීම, වචනවල උචිත අනුචිත භාවය නො සලකා හැරීම වැනි කරුණු මෙහි ලා කැපී පෙනෙයි. මෙ වැනි ගැටලු නිරාකරණය කර ගැනීමට අනුගමනය කළ යුතු අර්ථවත් ක්‍රමෝපාය පැහැදිලි කරන්න.

(ii) ලොව දේශගුණික රටාව බලවත් අයුරින් විපත්තිකර වෙනසකට පත් ව ඇත. ඇතැම් මිනිස් ක්‍රියාකාරකම් නිසා පෘථිවි ගෝලය අස්වාභාවික ලෙස උණුසුම්වීම මෙයට ප්‍රබල හේතුවකි. මෙයින් සිදු වන, සිදු විය හැකි විපත් බොහෝ ය. මේ තත්ත්වය මඟ හරවා ලෝක දේශගුණික රටාව මිනිසාට හිතකර වන සේ හැඩගස්වා ගත හැක්කේ කෙසේදැ යි විග්‍රහ කරන්න.

(iii) ස්වාභාවික විපත්තිවලින් වන විනාශය අවම කර ගැනීමට කෙටි කාලීන හා දිගු කාලීන ප්‍රායෝගික විසඳුම් සොයා ගැනීම අත්‍යවශ්‍ය ය. එසේ නො වුණ හොත් මනුෂ්‍ය සමාජයේ පැවැත්මට එරෙහි ව ඇති වන තර්ජන වළක්වා ගත නො හැකි ය. මේ සම්බන්ධයෙන් ඔබ ඉදිරිපත් කරන ප්‍රායෝගික විසඳුම් කවරේ දැයි පැහැදිලි කරන්න.

(iv) සාහිත්‍යය යනු සමාජයේ පිළිබිඹුවක් සේ සැලකෙන බැවින් එහි සමාජීය වටිනාකමක් තිබිය යුතු ය. එහෙත් ඇතැම් සිංහල ලේඛකයන්ගේ කෘතිවලින් එවැන්නක් පිළිබිඹු නොවේ යැ'යි මතයක් ද පවතියි. මේ චෝදනාවෙන් මිදීම සඳහා සිංහල ලේඛකයන් ගතයුතු ක්‍රියාමාර්ග කවරේ දැයි සාකච්ඡා කරන්න.

(v) විදේශාධාර ලංකාවට සම්පතකි. එහෙත් ඇතැම් විටෙක එයින් දේශයේ ස්වාධීනත්වයට අහිතකර බලපෑම් ද එල්ල වේ. මෙය උභතෝකෝටික ප්‍රශ්නයකි. මේ ගැටලුව සැලකිල්ලට ගනිමින් අපගේ දේශය සමෘද්ධිය කරා මෙහෙයැවීමට අවශ්‍ය වන වැඩ පිළිවෙළ පහදන්න.

(ලකුණු 25 යි.)

[ දෙවැනි පිටුව බලන්න.

www.artsapi.lk

www.pastpaperlk.com

**2.** (අ) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

"ලංකාවේ බ්‍රාහ්මී අක්ෂර භාවිතයේ උපරිම කාල සීමාව ක්‍රිස්තු පූර්ව තුන් වන ශතවර්ෂය ලෙස ගණන් ගන්නා
අතර අධඃ සීමාව ක්‍රි.ව. හත් වන ශතකය ලෙස සැලකිය හැක. අට වන ශතවර්ෂයේ පටන් පසළොස් වන
ශතවර්ෂය තෙක් වූ කාලය වර්තමාන සිංහල අක්ෂර රූප විකාශනයට ගත වූ කාලයයි. ඒ යුගය පශ්චාද් බ්‍රාහ්මී
යුගය ලෙස සැලකේ. ක්‍රි.පූ. තුන් වන ශතවර්ෂයේ පටන් ක්‍රි.පූ. පළමු වන ශතවර්ෂයේ පූර්ව භාගය තෙක් පූර්ව
බ්‍රාහ්මී යුගය ලෙස ද එතැන් පටන් ක්‍රි.ව. හත් වන ශතවර්ෂය තෙක් අපර බ්‍රාහ්මී යුගය ලෙස ද බෙදා දැක්වීමට
තරම් අකුරුවල විශේෂ ලක්ෂණ විද්‍යමාන වේ. පූර්ව බ්‍රාහ්මී යුගයේ ලක්ෂණ මෙසේ හඳුනා ගැනීමට පුළුවන් වේ.
ලෙන්වල කටාරම් රේඛාවට යටින් කොටා තිබෙන වාක්‍ය ඉතා කෙටි ය. කේවල දීර්ඝ ස්වර හෝ ව්‍යඤ්ජනාශ්‍රිත
දී... ...ර හෝ දක්නට නො ලැබේ. සංයුක්තාක්ෂර හෝ මහාප්‍රාණාක්ෂර විරල ය. මේ යුගයේ විද්‍යමාන අකුරු
එකිනෙක ... සසඳා බැලීමේ දී ඒවා ලංකාවට ආවේණික වූ අක්ෂර, අශෝක අධිරාජ්‍යයේ බටහිර හා දකුණු
ප්‍රදේශවල දක්නා ...ෂර හා මධ්‍යම සහ ...ගෙනහිර ඉන්දියානු ප්‍රදේශවල දක්නා අක්ෂර යයි අක්ෂර ගණත්‍රයක
ලා ගිණිය හැකි ... ...පෙනේ. එයින් ... ) අනුමාන කරන්නට හැකි වී තිබෙන්නේ එකල සම්මිශ්‍රිත බ්‍රාහ්මී
හෝඩියක් ලංකාවේ භාවිත වූ ...කි."

(i) ලංකාවේ අක්ෂර සංවර්ධනයේ අවස්ථා කීයක් මේ ඡේදයෙන් හෙළි වේ ද? ඒ මොනවා ද?
(ii) අක්ෂර භාවිතයේ අධඃ සීමාව යන්නෙන් මේ ලේඛකයා අදහස් කළේ කුමක් ද?
(iii) පූර්ව බ්‍රාහ්මී යුගයේ ලේඛනවල කැපී පෙනෙන විශේෂ ලක්ෂණ තවරේද?
(iv) කේවල දීර්ඝාක්ෂර හා සංයුක්තාක්ෂර යනු මොනවා ද?
(v) පූර්ව බ්‍රාහ්මී යුගයේ සම්මිශ්‍රිත බ්‍රාහ්මී හෝඩියක් ලංකාවේ පැවති බවට අනුමාන කළ හැකි සාධක දක්වන්න.

(ලකුණු 10 යි.)

(ආ) පාසැල් ක්‍රීඩා සංගම් රැස්වීමේ දී, "ක්‍රීඩාව ජීවිතයට දෙන එළිය" මැයින් ඔබ පැවැත් වූ දේශනය ලිඛිත ව ඉදිරිපත් කරන්න. **(මේ සඳහා වචන 250 ක් පමණ සෑහේ)**

(ලකුණු 15 යි.)

**3.** (අ) පහත දැක්වෙන එක් එක් වාක්‍යයක, එක් පදයක අක්ෂර වින්‍යාසය සදොස් ය. ඒ පදය පමණක් නිවැරදි කොට ලියන්න.

(i) දේවදත්ත පාපිෂ්ට වූ දුෂ්ට වූ චරිතයෙන් යුක්ත වූයේ ය.
(ii) ප්‍රෞඩත්ව ලක්ෂණ නිරූපිත එකී චරිතයෙහි ඇතැම්විට ශුභ ලක්ෂණ ද විද්‍යමාන විය.
(iii) ලංකා ඉතිහාසයේ අද්භූත සිද්ධි ගැන විමසූ ඇතැම් ඉතිහාසඥයෝ විස්මයට පත් වූහ.
(iv) මොණරා තුරු සෙවණැල්ලේ පිල් විදහා නටයි.

(ආ) පහත දැක්වෙන පද අකාරාදි පිළිවෙළින් ඉදිරිපත් කරන්න.

ජයවර්ධනපුර, කොළඹ, රුහුණ, කැලණිය, සබරගමුව, මොරටුව, යාපනේ, පේරාදෙණිය, රජරට, වයඹ

(ඉ) පහත දැක්වෙන පද සන්ධි කරන්න.

(i) යස ඉසුරු
(ii) පස් සිය
(iii) ගුරු අක්ෂර
(iv) රීති අනුකූල

(ඊ) පහත දැක්වෙන පද විසන්ධි කරන්න.

(i) අරුණලු
(ii) ශාස්ත්‍රාලය
(iii) දැත

(උ) 'චතුර' යන්නෙන් 'චාතුර්ය' යන පදය සැදෙන්නාක් මෙන් 'ඊශ්වර' යන්නෙන් සැදෙන පදය කුමක් ද?

(ඌ) 'රුඳවියන්' / 'රුඳවූවන්' යන පද දෙකින් නිවැරදි පදය කුමක් ද?

(එ) 'දිගටී' යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඒ) 'ප්‍රත්‍යක්ෂ' යන පදයෙහි ඇතුළත් උපසර්ගය කුමක් ද?

(ඔ) පහත දැක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) අනාථනාථ වූ
(ii) රසාලිප්ත වැකිය

(ඕ) පහත දැක්වෙන වාක්‍යවල සදෝස් තැන් ඇතොත් නිදෙස් කරන්න.

(i) ඇතැම් ආරෝග්‍යශාලා සේවකයෝ වැඩ වර්ජනය කරන බව කාටත් පෙනිණ.
(ii) පසුගිය දශකයෙහි මහකලාකරුවන් පහළ වූහ.

(ලකුණු 20 යි.)

www.pastpaperlk.com www.artsapi.lk

(ඇ) පහත දැක්වෙන පදවලට මුල් වුණු ප්‍රකෘති රූප වෙන් කොට දක්වන්න.

(i) වැද්දෙක්   (ii) තාරාවා   (iii) පත්දමා
(iv) හරකෙක්   (v) අලියෙකු   (vi) ජපනෙක්

(ආ) පහත දැක්වෙන පද අතුරෙන් උක්ත පදත් අනුක්ත පදත් වෙන් කොට ලියන්න.

(i) කවීන්   (ii) වඩුවෝ   (iii) කිවිඳියක
(iv) සත්තු   (v) තෙරුන්   (vi) ඇතැමෙක්

(ඉ) පහත දැක්වෙන පදවලට අනුරූප පූර්ව ක්‍රියා පද ලියන්න.

(i) විචාරයි   (ii) පියයි   (iii) කලඹයි
(iv) වැටේ   (v) විකුණයි   (vi) අඳියි

(ඊ) පහත දැක්වෙන පදවල ඇතුළත් වන උපසර්ග වෙන් කොට දක්වන්න.

(i) නිකෙලෙස්   (ii) අවධාරණ   (iii) උද්ඝෝෂණ
(iv) උපදේශ   (v) අභිවර්ධන   (vi) විපක්ෂ

(උ) පහත දැක්වෙන නාම පදවල ඇතුළත් වන තද්ධිත ප්‍රත්‍යය වෙන් කොට දක්වන්න.

(i) නියවතුන්   (ii) කොළුලන   (iii) සිරිමත්
(iv) දෛනික   (v) ග්‍රාමීය   (vi) ශූරතා

(ලකුණු 15 යි.)

5. (අ) පහත දැක්වෙන වාක්‍යවල නිදෙස් තැන් ඇතොත් නිදෙස් කොට ලියන්න.

(i) මධ්‍යස්ථ පාලකයෙකු පහළ වේ වා.

(ii) සෞඛ්‍ය සේවකයන් වැටුප් විෂමතා පදනම් කර ගෙන මහජන විරෝධය ද නො තකා වැඩ වර්ජනය කළහ.

(iii) සිත්තරාණෝ කේන්ද්‍රීය රේඛාව ප්‍රේක්ෂකයනට වහා හඳුන නො වන අයුරින් සිතුවම නිම කළ බව විචාරකයා කීය.

(iv) අධිකරණ වෛද්‍යවරයා විසින් ඇයගේ මරණය අධික රුධිර වහනය නිසා සිදු වූවක් බව ප්‍රකාශ කළේ ය.

(v) දූන් දූන් සමහරෙක් නිරවද්‍ය අක්ෂර වින්‍යාසය අනාවශ්‍ය කොට සලකන්නා සේ පෙනේ.

(ආ) නිවැරදි වාක්‍යයක් නිර්මාණය කිරීම සඳහා සුදුසු පදය වරහන් තුළින් තෝරා ලියන්න.

(i) බොහෝ ප්‍රවීණ ගීත රචකයෝ (සංගීතඥයන් / සංගීතඥයෝ) ද වෙති.

(ii) (නැණවත්හු / නැණවතුන්) අදහස් ප්‍රකාශ කළහොත් ඒවාට මැනවින් කන් දිය යුතු ය.

(iii) දක්ෂ (ශල්‍ය වෛද්‍යවරයෙක් / ශල්‍ය වෛද්‍යවරයෙකු) වන්නේ කෙසේ ද?

(iv) තමන් දෙන දන් (භික්ෂූහු / භික්ෂූන්) පිළිගනිති යි සීගිරි කාශ්‍යපයෝ සිතූහ.

(v) (ශිෂ්‍යයෝ / ශිෂ්‍යයන්) දහවල් වන තෙක් නිදි නො ගත යුතු ය.

(ඉ) පහත දැක්වෙන වාක්‍ය කර්ම කාරක වාක්‍යවලට හරවන්න.

(i) හේ ජලාශ ඉදි කෙළේ ය.

(ii) දඩයම්කරුවා සාවා ද මුවා ද මරයි.

(iii) ගුණදාස අමරසේකරයෝ අසත් ද කව යළි නිර්මාණය කළාහු ය.

(iv) වෛද්‍යවරියක් රෝගියා සුවපත් කළා ය.

(v) ඇමෙරිකානුවෝ අහසරු මතට යානාවක් යවති.

(ලකුණු 15 යි.)

2\. (අ) පහත දැක්වෙන ඡේදය කියවා, අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

අනුභූතියක් යනු කවියා විඳින රසාත්මක වින්දනයයි; පහන් සංවේගයයි. ඒ වැන්නක් කවියා ගේ හද තුළ වී ද යන්න අප දැනගන්නේ කෙසේ ද? ඒ සඳහා අප සතු ව ඇති එක ම මග වනුයේ කවියා වහරන බසයි. ඒ බසට අප තුළ වින්දනයක්, පහන් සංවේගයක් ඇති කිරීමට හැකි වේ නම් එවිට අපට නිගමනය කළ හැකියි, කවියා තුළ රසාත්මක වින්දනයක්, අනුභූතියක් තිබුණු බව. ඒ බැවින් කවියා වහරන බස කවියාටත් සහෘදයාටත් පොදු වූ රස ජනනය කිරීමෙහි සමත් බසක් විය යුතුයි. කවියාට පමණක් සීමා වූ බසකින් එය කළ හැකි නො වේ. "ශිෂ්ටාචාරයේ හැඩි දැඩි කකුල", "ඉතිහාසයේ මළ මිනිය" ආදී වූ කවියාට පමණක් සීමා වූ බසකින් රස ජනනය කළ නො හැකි ය. එමෙන් ම භාවමය ප්‍රතික්‍රියා නොපතන පුවත් පත් බසක් වැන්නකින් හෝ අනුකරණය මගින් නිම කරන ලද කෘත්‍රිම බසකින් හෝ මේ කටයුත්ත ඉටු කරගත නො හැකියි.

(i) මේ ඡේදයෙහි දැක්වෙන ආකාරයට කවියාගේ බසෙහි සුවිශේෂත්වය කවරේ ද?

(ii) "භාවමය ප්‍රතික්‍රියා නොපතන පුවත් පත් බසක්" යන්නෙහි අර්ථය පැහැදිලි කරන්න.

(iii) පහන් සංවේගය යන්න මෙහි අන් කවර වචනයන් ගෙන් හඳුන්වා තිබේ ද?

(iv) කවියා ගේ අනුභූතිය සහෘදයා අත්දකින මාර්ගය කවරේ ද?

(v) කවියාට පමණක් සීමා වූ බසකින් ඔහුගේ අරමුණ ඉටුවේ ද?

(ලකුණු 10 යි.)

(ආ) ඔබ ගිය පාසල් අධ්‍යාපන චාරිකාවකින් ලැබූ හරවත් අත්දැකීම් තුනක් තෝරා ගෙන ඒවා ඔබට හරවත් වූයේ කෙසේ දැයි පැහැදිලි කරමින් පන්තිභාර ආචාර්යවරයා / ආචාර්යවරිය මගින් විදුහල්පතිතුමාට / විදුහල්පතිතුමියට කෙටි වාර්තාවක් ලියන්න. **(මේ සඳහා වචන 250 ක් පමණ සෑහේ.)**

(ලකුණු 15 යි.)

3\. (අ) පහත දැක්වෙන එක් එක් වාක්‍යයක, එක් පදයක අක්ෂර වින්‍යාසය **සදෙස් ය**. ඒ පදය පමණක් නිවැරදි කොට ලියන්න.

(i) සීගිරි තණ්ඨාවශේෂයන් ගෙන් හෙළි වන්නේ උත්කෘෂ්ට අතීතයකි.

(ii) ඇතැම් රටවල නපුංශක ජනගහනය පසලොස් ලක්ෂය ද ඉක්මවා ඇතැ යි වාර්තා වේ.

(iii) මහජන විරෝධ මර්ධනයට හමුද බලය යෙදීම නිරර්ථක ය.

(iv) පසුගිය වසරේ සහල් නිශ්පාදනය කෙතරම් ඉහළ ගියේ ද යත් එයට සරිලන වෙළෙඳ පොළ සොයා ගැනීම දුෂ්කර විය.

(ආ) පහත දැක්වෙන පද **අකාරාදි පිළිවෙළින්** ඉදිරිපත් කරන්න.

සපු, කීණ, දෙඹ, රැරහ, නා, මිදෙල්ල, එරහැඩි, පළොල්, හෝපලු, මී අඹ

(ඉ) පහත් දැක්වෙන පද **සන්ධි** කරන්න.

(i) සත් චාරිත්‍ර (ii) සකල ඓශ්වර්ය

(iii) අනු ඊක්ෂණ (iv) ප්‍රති උපකාර

(ඊ) පහත දැක්වෙන පද **විසන්ධි** කරන්න.

(i) විරෝද්දර (ii) පුනාරාගමන

(iii) මෝහොර

(උ) 'මධුර' යන්නෙන් 'මාධුර්ය' යන පදය සෑදෙන්නාක් මෙන් 'සුන්දර' යන්නෙන් සෑදෙන පදය කුමක් ද?

(ඌ) 'කන්‍යාවිය' / 'කන්‍යාව' යන පද දෙකින් නිවැරදි පදය කුමක් ද?

(එ) 'සිසිලස' යන පදයෙහි ඇතුළත් තද්ධිත ප්‍රත්‍යය කුමක් ද?

(ඒ) "නියඟ නිසා ගංහෝ වියළිණ." මෙහි 'නිසා' යනු කවර වර්ගයේ පදයක් ද?

(ඔ) පහත දැක්වෙන පාඨවල **අර්ථ** පැහැදිලි කරන්න.

(i) නයනානන්දකර රූප සම්පත්තිය

(ii) සුදුර්ලභ චරිතාපදානයක්

(ඕ) පහත දැක්වෙන වාක්‍යවල **සදෙස් තැන් ඇතොත් නිදෙස්** කරන්න.

(i) විවිධ වර්ගයේ කුරුල්ලෝ සැතපුම් දහස් ගණනක් දුර ගෙවා විදේශයන්හි සිට ලංකාවට එන බව පරිසරවේදීහු කියති.

(ii) නිවේදකයා සිනාමුසු මුහුණින් යුතු ව සාවද්‍ය උච්චාරණයෙන් ප්‍රවෘත්ති කියවනු ලබයි.

(ලකුණු 20 යි.)



www.pastpaperlk.com
www.artsapi.lk

6. පහත දක්වෙන පාඨවල අර්ථ පැහැදිලි කරන්න.

(i) ලප නොම වන් සඳ සේ සොම් ගුණෙනා

(ii) සාවුන් ගෙන් අං ලැබිය නො හැක්කා සේ

(iii) රාක්ෂස පරිගෘහීත විලක් සේ

(iv) දිඹුල මල නිසා වෙහෙසුණු වැනි දියැද

(v) වැලේ ගෙඩි වැලට බර නැ වගේ

(vi) තමා ඉසුරු වැ වරද ඉවැසුම් මහාත්ම ගුණයෑ

(vii) වාග්විෂයාතික්‍රාන්ත වූ ඇය ගේ ගුණ සපුව

(viii) අතීසාරයට අමුඩය ගැසීම

(ix) හරුබස්ස ම නැති වුණා

(x) හෙන්දිරික්කා මල් පිපෙන වේලාවෙහි ඇ වැටට ගියා ය.

(xi) පර්යාප්තිධර මහ තෙරණුවෝ

(xii) ජාඩියට මුඩිය වගේ

(xiii) දේවාතිදේව වූ ශක්‍රාතිශක්‍ර වූ බ්‍රහ්මාතිබ්‍රහ්ම වූ

(xiv) තලියේ පැනෙහි කිඹුලන් දුවුවා සේ

(xv) ගජ කුම් බිඳින එසයුරු කෙසරිඳු

(ලකුණු 15 යි.)

7 (i) "වෙහෙර විහාර", "සමිති සමාගම්", "කරුණු කාරණා" යන යුගල පද සෑදී ඇත්තේ කෙසේ ද? මේ වර්ගයේ තවත් යුගල පද දෙකක් දක්වන්න.

(ii) "මුහුදු දිය", "ගම් වැසි", "සරා සඳ" යන සමාස කවර වර්ගයට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් දක්වන්න.

(iii) "පන් සිල්", "දස සිල්", "දස රජදම්" යන සමාස කවර වර්ගයට අයත් වේ ද? මේ වර්ගයට අයත් තවත් සමාස පද දෙකක් දක්වන්න.

(iv) 'නූතන', 'පුරාතන' කවර වර්ගයට අයත් පද ද? මේ වර්ගයට අයත් තවත් පද දෙකක් දක්වන්න.

(v) 'ඇද්දළ', 'අල්ලස්', 'දුප්පත්' යන පද සන්ධි වී ඇත්තේ කෙසේ ද? ඒ අයුරින් ම සන්ධි වී ඇති තවත් පද දෙකක් දක්වන්න.

(ලකුණු 15 යි.)

8. පහත දක්වෙන මාතෘකා අතුරෙන් තුනක් පිළිබඳ ව කෙටි සටහන් ලියන්න.

(i) මූර්ධජ අක්ෂර

(ii) සාම්ප්‍රදායික මිශ්‍ර සිංහල හෝඩියට අලුතෙන් එක්වුණු අකුරු සහ එකී අකුරු හෝඩියේ තැන්පත් කළ ස්ථාන

(iii) අන්‍යාර්ථ සමාසය

(iv) සකර්මක ක්‍රියා සහ අකර්මක ක්‍රියා

(v) පහත දක්වෙන පාඨවලින් සතරකට සුදුසු ප්‍රස්තාව පිරුළු සතරක් දක්වා එයින් එක් ප්‍රස්තාව පිරුළක් යොදා ගනිමින් එහි අර්ථය ප්‍රකට වන සේ වාක්‍යයක් ලියන්න.

(අ) වරද කළ පිරිසෙහි දුර්වලයනට පමණක් විරෝධය පෑම

(ආ) පාලකයන් විසින් පාලිතයන් දුකට පත් කිරීමක්

(ඉ) උද්ඝෝෂණයේ ප්‍රචාරණයට ප්‍රතිඵල නො ලැබීමක්

(ඊ) අනුන් කරන නිසා ම නො විමසා කරන වැඩක්

(උ) ඉතා කලාතුරකින් වන සිදුවීමක්